# ලංකාණ්ඩුවේ “ගැසට්” පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

නො. 7,858 — 1931ක්වූ ජූනි මස 5 වෙනි දිනවූ සිකුරාදා.


## Part IV.— හතරවෙනි කාණ්ඩය.

### උපාධිග නීති.

K 326/31

“ 1896ගේ අඞ්ක 13 දරන වන්දනා ආඥාපනත.”

කතරගම වන්දනාගමන සහ උත්සවය පැවැත්වීම සඳහා එකී විශෙෂ ආරක්ෂා උවමනාවී තිබෙන බැවින්ද, ඉදිරියටත් උවමනාවන බැවින්ද, 1897ගේ අඞ්ක 7 දරන ආඥාපණතෙන් හරිගස්වනලද “ වන්දනාගමන පිළිබඳ ආඥාපණතකැ ” යි නම්ලත් 1896ගේ අඞ්ක 13 දරන ආඥාපණත යටතේ කාරක මන්ත්‍රීසභාවේ අනුශාසනය ඇතුව ආණ්ඩුකාර උතුමාණන්වහන්සේ විසින් පණවනලද පහත දැක්වෙන ව්‍යවස්ථා සහ නියෝග මින් ඉහත වර්‍ෂ ගණනක් වර්‍ෂයක් පාසා ප්‍රසිද්ධකළ ව්‍යවස්ථා වෙනුවට පොදුජනයාගේ දැනගැන්ම සඳහා ප්‍රසිද්ධකරනු ලැබේ.

උතුමාණන්වහන්සේගේ අණපරිදි,

බී. එච්. බූර්ඩිලොන්,
මහලේකම් වම්හ.

වර්‍ෂ 1931ක්වූ ජූනි මස 2වන දින කොළඹ
මහලේකම්තැනගේ කන්තෝරුවේදීය.

---

ව්‍යවස්ථා.

1. සනීපාරක්ෂාව සලකා කතරගම ඇසල උත්සවය සහ කතරගම වන්දනාකාරයින්ගේ නැවතීම පිළිබඳ කාලය 1931යේ ජූලි මස 16වෙනි දින පටන් ජූලි මස 30වෙනි දින දක්වා දවස් 15ට සීමා කළයුතු බැවින් එය මෙයින් එසේ සීමාකරනු ලැබේ.

2. උත්සවය පවතිනා අතර කතරගම වසංගතරෝගයක් ඇති වුණොත් උත්සවය අවසානවූයේයයි ප්‍රකාශකරන්නටද, ඒ ගම හැර තමතමන්ගේ ගම්වලට වන්දනාකාරයින්ට වහාම යන්නට අණකරන්නටද, ඔවුන් යායුතු මාර්‍ග නියමකරන්නටද නියෝග ඉෂ්ටකිරීම සඳහා පත්වී සිටිනා මුලාදෑනින්ට නීතිප්‍රකාර බලය තිබේ.

3. නියෝග ඉෂ්ටකරවීම සඳහා පත්ව සිටින මුලාදෑනින්ට කතරගම දීද කතරගමට යන එන අතරමගදීද—

(*a*) ගේදීමට හා නෑමටද, වතුර ඇදගන බිමටද, ශරීරකෘත්‍යයන් සඳහාද වන්දනාකාරයින්ගේ විශෙෂ ප්‍රයෝජනයට විශෙෂ ස්ථාන නියමකරන්නටද;

(*b*) එක් එක් වර්‍ගයේ වන්දනාකාරයින්ට නැවතීමට ස්ථාන නියම කරන්නටද;

(*c*) යම්කිසි වන්දනාකාරයින් කාණ්ඩයක් විසින් ගතයුතු මාර්‍ග නියමකරන්නටද ;

(*d*) වන්දනාකාරයින්ට දෙන සියලුම ආහාර බෙදාදීම භාරූ වන්නටද ;

(*e*) අසනීපවන වන්දනාකාරයින්ගේ ප්‍රයෝජනයට වාසස්ථාන නියමකරන්නට, ඔවුන් සමග ගණුදෙනු කටාබද තහනම් කරන්නට සහ ඔවුන්ට යාම නුසුදුසුවන්නම් නවතාගන්නටද බලය තිබේ.

පත්ව සිටින මුලාදෑනින් විසින් දෙන නියෝගයක් නොසලකන යමෙක් ඇද්ද හෙතෙම වරදක්කිරීම ගැන වැරදිකාරයෙක් වේ.

4. මේ ව්‍යවස්ථා සඳහා මහා දේවාලයේ සිට සෑම දෙසින්ම හැතැප්ම් බාගයක් ඇතුළත ප්‍රදෙශය වාඩියයි සලකනු ලැබේ.

5. අතරමගදී හෝ වාඩියේදී වෛද්‍ය නිලධාරිතැන විසින්, හෝ එබන්දෙක් නැති තැන පොලිසියේ ප්‍රධාන මුලාදෑනියා විසින් ආහාරයට නුසුදුසුයයි ප්‍රකාශකරන සියලුම ආහාර ද්‍රව්‍ය තහනම්ට ගෙන විනාශකරදමන්නට පොලිසියට බලයදී නියමකරනු ලැබේ. මෙම රාජකාරිය හෝ මෙම ව්‍යවස්ථාවලින් නියමකරනුලබන වෙනයම් රාජකාරියක් ඉෂ්ටකිරීමේදී පොලිසියට හරස්ව සිටින හෝ බාධාකරනා යමෙක් ඇත්නම් හෙතෙම වරදක්කිරීම ගැන වැරදිකාරයෙකැයි සලකනු ලැබේ.

6. ස්ථානපාලක නිලධාරිතැනගෙන් අවසරපත්‍රයක් ලබාගෙන හෝ එබඳු අවසරපත්‍රදීමට එකී නිලධාරිතැනගෙන් බලය ලත් නමකුගෙන් අවසරපත්‍රයක් නැතුව වාඩියේ සිට සැතැප්ම කාලක් ඇතුළතට යම්කිසි ගවයකු හෝ කරත්ත ගොනකු ගෙනෙන යම් කෙනෙක් ඇද්ද ඒ අය වරදක් කිරීම ගැන වැරදිකාරයෙකැයි සලකනු ලැබේ. එබඳු අවසරපත්‍ර දෙන්නේ සනීප ආරක්‍ෂක කටයුතු ඉෂ්ටකිරීම හා වාඩියෙ සන්පය පවත්වාගැනීම සඳහා ස්ථානපාලක නිලධාරිතැන විසින් නියමකරන නියෝග අවසරපත්‍ර ලත් අය ඉෂ්ට කරන පොරොන්දුවපිටය.

7. වෙළඳාම් පිණිස බඩු තැබීම සඳහා වාඩිය භාර මුලාදෑනිතැන විසින් වෙන්කර තිබෙන තැනක හැර වාඩියේ වෙන යම් ස්ථානයක වෙළඳාම්ට මොනම වර්ගයක නමුත් බඩු තබන යම් කෙනෙක් ඇද්ද ඒ අය වරදක්කිරීම ගැන වැරදිකාරයෙකැයි සලකනු ලැබේ. තවද වෛද්‍ය මුලාදෑනිතැන විසින් හෝ ඔහු නැති තැන පොලිසියේ ප්‍රධාන නිලධාරිතැන විසින් ආහාරයට නුසුදුසුයයි නියමකරනුලබන කෑමවර්ග විකුණන යමෙක් ඇත්නම් ඔහුද වරදක්කිරීම ගැන වැරදිකාරයෙකැයි සලකනු ලැබේ.

8. වාඩියේ නැවතීසිටින අතර ශරීර කෘත්‍යයන් සඳහා ආණ්ඩුවෙන් සලසා තිබෙන ස්ථානයක හැර අන් තැනක එබඳු කෘත්‍යයන් කරන හෝ මළ පහකළ පසු එය පස් හෝ වැලි දමා නොවසන යමෙක් ඇද්ද, එම කාලයතුළම වාඩිය භාර මුලාදෑනියා විසින් නියමකරන ස්ථානයට ඉහළින් ගඟට බසින හෝ එහි නාන යමෙක් ඇද්ද ඒ අය වරදක්කිරීම ගැන වැරදිකාරයෙකැයි සලකනු ලැබේ.

9. බෝවෙන හෝ පැතිරෙන රෝගයකින් පෙළෙමින් සිටින ඒ බව වෛද්‍ය මුලාදෑනිතැනට හෝ ඔහු නැතිවිට පොලිසියේ ප්‍රධාන මුලාදෑනිතැනට නොදන්වන යමෙක් ඇද්ද, එබඳු රෝගය සැඟවීමට ආධාරකරන හෝ අනුබලදෙන යමෙක් ඇද්ද, ඒ අය වරදක්කිරීම ගැන වැරදිකාරයෙකැයි සලකනු ලැබේ.

10. සියලුදෙනාම අතරමග නවතින ස්ථානවලදීද, වාඩියේදීද, පොලිසියේ ප්‍රධාන නිලධාරිතැන විසින් තමතමාට නියමකරන නවාතැන්පලේ නැවතිය යුතුයි. එසේ කිරීම බැරිය කියන හෝ පැහැර හරින යමෙක් ඇද්ද ඒ අය වරදක්කිරීම ගැන වැරදිකාරයෙකැයි සලකනු ලැබේ.

11. ස්ථානපාලක නිලධාරිතැනගෙන් කලින් අවසර ලබානොගෙන වාඩියේ ප්‍රධානවීථි අසුවනසේ යම් මඩුකුඩමක් තැනීම හෝ ගොඩනැගිල්ලක් විශාලකිරීම හෝ යුතුනොවේ.

## ආණ්ඩුවේ ඉඩම් විකිණීම හෝ බදුදීම සඳහා දැන්වීම.

**Kandy No. 183.**—මධ්‍යම දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1931ක්වූ ජූලි මස 24වෙනි සිකුරාදා පෙරවරු 10.30ට මහනුවර කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කර දෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. මධ්‍යම දිසාවේ මහනුවර පලාතේ උඩපලාත කෝරළයේ පිහිටා තිබෙන බිම්කැබලි 35ක්.

මුල් සිතියමේ නො. Advance Extract 2 B. S. P. P. 1. ගම—ගම්පොල ලෝකල්බෝඩ් සීමාවතුල ගොඩගම.

අයිතිකමකියන්නා—ආණ්ඩුව.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 2 | පොල්වත්තෙවත්ත | ජී. ජී. වීරසූරිය මැතිනිය | අත්හැරදමා තිබෙන පි. ඩබ්ලිව්. ඩී. පාර | 0 | 0 | 16·72 | 2,010 |

මුල් සිතියමේ නො. 8,774. ගම—පුපුරැස්ස.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 2 | බුලත්ගමහේන | — | කේ, ආර්. ඇම්. පොන්නසාමි පිල්ලෙ විසින් බලහත්කාරයෙන් අල්ලා තිබේ | 0 | 2 | 12 | 1,510 |

මුල් සිතියමේ නො. 8,812.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 1 | පුපුරැස්සෙවත්ත | — | කේ, ලිප්ටන්ස් සමාගම විසින් බලහත්කාරයෙන් අල්ලා තිබේ | 7 | 2 | 21 | 1,010 |
| 2 | දියහිල්ලකැලේ නොහොත් කුඹාදුරයැඳෙව | — | කැලෑව | 0 | 0 | 18 | 110 |
| 3 | පුපුරැස්සෙවත්ත | — | කේ, ලිප්ටන්ස් සමාගම විසින් බලහත්කාරයෙන් අල්ලා තිබේ | 4 | 0 | 24 | 1,010 |

මුල් සිතියමේ නො. 8,375. ගම—තුම්පැලවක.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 3 | නාදඹුහින්නේමුකලාන | — | වෙදහැටේවත්තට බලාහත්කාරයෙන් අල්ලා තිබේ | 13 | 3 | 7 | 1,210 |
| 4 | එම | — | එම | 4 | 3 | 5 | 1,210 |
| 5 | නාදඹුහින්න | — | පාරට ඉතුරුකර තිබෙන බිම | 0 | 3 | 8 | —* |
| 6 | එම නොහොත් ඇටඹගහමුල හේන නොහොත් මොර ගොම්මන | — | එම | 0 | 0 | 30 | —* |
| 9 | ඇටඹගහමුලහේන නොහොත් මොරගොම්මන පතන | — | අඩිපාරට ඉතුරුකර තිබෙන බිම | 0 | 0 | 4 | —* |
| 23 | නාදඹුහින්න | — | පාරට ඉතුරුකර තිබෙන බිම | 0 | 3 | 0 | —* |
| 33 | එම | — | දෙනිය, උල්පත්වලට ඉතුරුකර තිබෙන බිම | 0 | 0 | 19 | —* |
| 35 | එම | — | පාරට ඉතුරුකර තිබෙන බිම | 0 | 3 | 31 | —* |
| 37 | එම නොහොත් බනගෙපිටියේවත්ත | — | මූකලාන, උල්පත්වලට ඉතුරුකර තිබෙන බිම | 0 | 0 | 32 | —* |
| 39 | නාදඹුහින්න | — | කේ, ඇම්. ආර්. මුත්තුකරුපන් විසින් බලාත්කාරයෙන් අල්ලා තිබේ | 0 | 1 | 0 | 760 |
| 41 | එම | — | එම | 0 | 0 | 15 | 760 |
| 44 | එම | — | එම | 0 | 0 | 9 | 760 |
| 50 | එම නොහොත් පලාගොල්ල | — | මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ කොඩි ගහට ඉතුරුකර තිබෙන බිම | 0 | 1 | 32 | —* |
| 56 | පලාගොල්ල නොහොත් ගල් කඹුල්ල | — | කේ, ඇම්. ආර්. මුත්තුකරුපන් විසින් බලහත්කාරයෙන් අල්ලා තිබේ | 0 | 0 | 33 | 760 |
| 57 | එම | — | පාරට ඉතුරුකර තිබෙන බිම | 0 | 3 | 33 | —* |
| 59 | එම | — | කේ, මුත්තුකරුපන් විසින් බලහත්කාරයෙන් අල්ලාතිබේ | 0 | 1 | 35 | 760 |
| 68 | පලාගොල්ල | — | කේ, ඒ. පී. ඇස්. පී. පොන්නම්පලම්පිල්ලේ විසින් බලහත්කාරයෙන් අල්ලාතිබේ | 0 | 0 | 32 | 1,010 |

අයිතිකමකියන්නා—ආණ්ඩුව සහ පී. ඕ. සින්නයියා.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 69 | පලාගොල්ලේකුඹුර නොහොත් ආවුම්ගෙනකුඹුර | — | අත්ඇරදමා තිබෙන කුඹුර | 3 | 1 | 11 | 210 |

අයිතිකමකියන්නා—ආණ්ඩුව සහ ඒ. පී. ඇස්. පී. පොන්නම්පලම්පිල්ලේ.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 70 | එම | — | අත්ඇරදමා තිබෙන කුඹුර | 0 | 1 | 5 | 210 |

අයිතිකමකියන්නා—ආණ්ඩුව සහ ඇම්. ආර්. මුත්තුකරුපන්.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 71 | පලාගොල්ලේවත්ත | — | තේ | 0 | 2 | 36 | 760 |
| 72 | එම | ආණ්ඩුව සහ ඇම්. ආර්. මුත්තුකරුපන් | එම | 1 | 1 | 5 | 760 |

අයිතිකමකියන්නා—ආණ්ඩුව.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 74 | පලාගොල්ල | — | පාරට ඉතුරුකර තිබෙන බිම | 0 | 0 | 8 | —* |
| 76 | එම | — | එම | 0 | 0 | 3 | —* |

අයිතිකමකියන්නා—ආණ්ඩුව සහ ඇම්. ආර්. මුත්තුකරුපන්.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 77 | එම | — | තේ | 0 | 1 | 31 | 510 |

අයිතිකමකියන්නා—ආණ්ඩුව.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 78 | එම | — | තුම්පැලවකඹයට ඉතුරුකර තිබෙන බිම | 1 | 1 | 3 | —* |
| 79 | එම | — | එම | 0 | 1 | 4 | —* |
| 80 | එම | — | එම | 0 | 1 | 11 | —* |
| 81 | එම | — | එම | 0 | 0 | 11 | —* |

මුල් සිතියමේ නො. 8,832. ගම—කහටපිටිය.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 7 | ගුදමේවත්ත නොහොත් කැබැරුමේවත්ත | — | මුඩුබිම | 0 | 0 | 19·45 | —* |
| 9 | පොල්වත්ත | — | එම | 0 | 0 | 0·39 | —* |

* නොවිකුණ ඉතුරුකරණු ලැබේ.

මෙම ඉඩම් සම්බන්ධ වැඩිදුර කාරණ මධ්‍යම දිසාවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ මුල් සිතියම් සර්වෙයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගන්ට පුළුවන.

වර්ෂ 1931ක්වූ මැයි මස 29වෙනි දින කොළඹ මහ ලේකම් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

බී. ඒච්. බෝර්ඩිලන්,
මහ ලේකම් වර්‍යා.

## ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීම.

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොවැම්බර 3වෙනි ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—පරණ පන්සල පාරෙ සන්දිය ලඟට දොඩන්දූවේ දෙගල්ලේ සනීපාරක්ෂක සභාවේ අළුත්පාරක් තැනීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" හතවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට, කාරක මන්ත්‍රීසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් හිසි ආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

සිතියමේ නො. 14,283. ගම—දෙගල්ල.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 1 | අළුත්හල්ලේගෙවත්ත නොහොත් සූරියගහවත්ත | පොල්වැවිච්ච ඉඩම සහ හුනුගල් තාප්පෙක පංගුවක් | ගොඩබැද්දේ පදිංචි ජනිස් ද සිල්වා වීරරත්න | 0 | 0 | 5 |
| 2 | සූරියගහවත්ත නොහොත් අඹගහවත්ත | පොල්ගහක් සහ සූරියගහක් වැවිච්ච ඉඩම | දෙගල්ලේ පදිංචි ඒ. නන්දිසේන, ඩබ්ලිව්. ඉසෝහාමි, ඇල්. එච්. ඇල්. හෙන්‍රික් සිල්වා | 0 | 0 | 0·8 |
| 3 | එම .. | සූරියගහක් වැවිච්චඉඩම .. | ගොඩබැද්දේ පදිංචි ජනිස් ද සිල්වා වීරරත්න | 0 | 0 | 0·8 |
| 4 | එම .. | වැවිල්ලක් නැති ඉඩම .. | දෙගල්ලේ පදිංචි ඒ. නන්දිසේන .. | 0 | 0 | 0·6 |
| 5 | එම .. | එම .. | එම .. .. | 0 | 0 | 0·5 |
| 6 | සූරියගහවත්ත .. | පොල්ගහක් වැවිච්ච ඉඩම .. | ඩබ්ලිව්. ඉසෝහාමි, (2) ජී. ඩී. සුමේනිහාමි, (3) ආර්. කේ. බබුන්හාමි, (4) ආර්. කේ. එලියස් | 0 | 0 | 0 5 |
| 7 | එම .. | දෙල්ගහක් වැවිච්ච ඉඩම .. | එම .. .. | 0 | 0 | 1 |
| 8 | අඹගහවත්ත .. | දෙල්ගස් 2ක් සහ පොල්ගහක් වැවිච්ච ඉඩම | ඩබ්ලිව්. එසෝහාමි, (2) ඩබ්ලිව්. දියනිස් ද සිල්වා | 0 | 0 | 1·5 |
| 9 | පුංචිඅඹගහවත්ත .. | පොල්ගස් දෙකක් සහ තවත් පලතුරුගස් යනාදිය වැවිච්ච ඉඩම | (1) ඩබ්ලිව්. කරෝලිස් සිල්වා, (2) ඩබ්ලිව්. එසෝහාමි, (3) ඩබ්ලිව්. ඒ. සිරිසේන, දෙගල්ලේ පදිංචි සහ (4) ඇල්. එච්. සවිහාමි | 0 | 0 | 1·3 |
| 10 | ලිඳගුලවත්ත .. | දෙල්ගහක් වැවිච්ච ඉඩම .. | (1) ඩබ්ලිව්. කරෝලිස් සිල්වා, (2) ඩබ්ලිව්. ඒ. සිරිසේන | 0 | 0 | 0·3 |
| 11 | පුංචිඅඹගහවත්ත .. | පොල්ගහක් සහ තවත් ගස්කොලන් යනාදිය වැවිච්ච ඉඩම | ඩබ්ලිව්. එසෝහාමි, (2) ඩබ්ලිව්. ඒ. සිරිසේන, (3) ඩබ්ලිව්. කරෝලිස් සිල්වා | 0 | 0 | 3·5 |
| 12 | මහකුරුඳුගහවත්ත .. | අඩිපාරක් සහ පොල් ගහක් වැවිච්ච ඉඩම | දෙගල්ලේ පදිංචි ඩබ්ලිව්. එසෝහාමි, ඩබ්ලිව්. ඒ. සිරිසේන | 0 | 0 | 1·4 |
| 13 | එම .. | පොල්ගහක් සහ තවත් ගස්කොලන් යනාදිය වැවිච්ච ඉඩම | හික්කඩුවේ පදිංචි ගුරුගේ චන්ද්‍රදේව .. | 0 | 0 | 0·4 |
| 14 | එම .. | එම .. .. | කතලූවේ පදිංචි වඩුගේ ජේන්නෝනා .. | 0 | 0 | 0·2 |
| 15 | එම .. | වැවිච්ච නැති ඉඩම .. | කතලූවේ පදිංචි වඩුගේ ජේන්නෝනා .. | 0 | 0 | 0·1 |
| 16 | එම .. | පුවක්ගහක් සහ වෙනත් ගස්කොලන් යනාදිය වැවිච්ච ඉඩම | දොඩන්දූවේ පදිංචි ඇස්. කේ. එන්සෝහාමි .. | 0 | 0 | 1·4 |
| 17 | එම .. | කොස්ගහක් සහ තවත් ගස්කොලන් යනාදිය වැවිච්ච ඉඩම | එම .. .. | 0 | 0 | 3·1 |
| 18 | එම .. | පොල්ගස් තුනක් සහ තවත්ගස්කොලන් යනාදිය වැවිච්ච ඉඩම | හික්කඩුවේ පදිංචි ගුරුගේ චන්ද්‍රදේව .. | 0 | 0 | 3·8 |
| 19 | එම .. | කොස්ගහක් සහ තවත් ගස්කොලන් යනාදිය වැවිච්ච ඉඩම | දෙගල්ලේ ඩබ්ලිව්. දනෙහස් ද සිල්වා .. | 0 | 0 | 1·5 |
| 20 | එම .. | හුනුගල්තාප්පයක්ද, බැම්මෙන් බැඳපු ගෙයකින් පංගුවක් සහ එක පොල්ගහක් වැවිච්ච ඉඩම | ඩබ්ලිව්. ඔන්දිරිස් ද සිල්වා .. | 0 | 0 | 3·7 |
| 21 | පුංචිකවුකුරුඳුගහවත්ත | පොල්ගස් පහක් සහ තවත් ගස්කොලන් යනාදිය වැවිච්ච වත්ත | වඩුගේ දියෝනිස් ද සිල්වා .. | 0 | 0 | 5·3 |
| 22 | එම .. | වැවිල්ලක් නැති ඉඩම .. | එම .. .. | 0 | 0 | 0·2 |
| 23 | එම .. | අඩිපාරෙන් පංගුවක් සහ පොල් ගස් තුනක් සහ තවත් දේවල් වැවිච්ච ඉඩම | එම .. .. | 0 | 0 | 5·5 |
| 24 | පුංචිකවුකුරුන්දුගහවත්ත | අඩිපාරකින් පංගුවක් සහ පොල් ගස් 4ක් වැවිච්ච ඉඩම | දෙගල්ලේ පදිංචි ඇම්. කේ. අගොස්සිනෝ | 0 | 0 | 2·2 |
| 25 | ගලගාවවත්ත .. | පොල්ගහක් සහ වෙනත් ගස්කොලන් යනාදිය වැවිච්ච ඉඩම | දෙගල්ලේ පදිංචි ඩබ්ලිව්. අගෝරිස් ද සිල්වා .. | 0 | 0 | 2·3 |
| 26 | පුංචිඅඹගහවත්ත .. | අඩිපාරකින් පංගුවක් සහ පුවක් ගස් 5ක් වැවිච්ච ඉඩම | දෙගල්ලේ පදිංචි (1) ඇම්. අබේහාමි, (2) ඩබ්ලිව්. අප්පුසිංඤෝ, (3) ඇම්. ජී. ලවුනේරිස් සහ ගොඩබැද්දේ පදිංචි ඇම්. ඩබ්ලිව්. පීටර් | 0 | 0 | 3·1 |
| 27 | නසිකන්දේවත්තේගේ කොරටුව | පොල්ගහක් සහ තවත් ගස්කොලන් යනාදි වැවිච්ච ඉඩම | ලෑබූනහේවා සවිහාමි .. .. | 0 | 0 | 7·5 |
| 28 | නාගරගලවත්ත .. | කොස්ගහක් වැවිච්ච ඉඩම .. | දෙගල්ලේ පදිංචි ඩබ්ලිව්. අන්ද්‍රිස්හාමි, (2) ඩබ්ලිව්. කරෝලිස්, (3) ඩබ්ලිව්. සියනෝබබා, (4) ඩබ්ලිව්. ඉසන්අප්පු | 0 | 0 | 0·5 |
| 29 | හසිකන්දේවත්තේගේ කොරටුව | වැවිල්ලක් නැති ඉඩම.. .. | කේ. ජී. කරෝහාමි, (2) ඩබ්ලිව්. පීටර්, (3) (3) ඩබ්ලිව්. ලෑසිරි, (4) ඩබ්ලිව්. සෝපිනෝනා | 0 | 0 | 0·1 |

එබැවින් ඉඩම් අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම හෝ තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1931ක්වූ ජූලි මස 1වෙනි දින උදේ 9ය කණිසමට දොඩන්දූවේ ගම්සභාශාලාවේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒවා ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1931ක්වූ මැයි මස 29වෙනි දින
ගාල්ලේ කච්චේරියේදීය.

පී. ජේ. බර්සන්,
ආණ්ඩුවේ ගාල්ලේ උප ඒජන්ත වරයා.

කිසියම් කෙනෙකුගේ හෝ කිසියම් ඉල්ලීමක් ඒත්තු නොගැනීමට ඒජන්ත උන්නාන්සේට හෝ උන්නාන්සේ වෙනුවෙන් මෙම කොන්දේසිගේදී ක්‍රියාකරණ තැනට සම්පූර්ණ බලය තබාගන්නා ඇත.

4. මෙම ලැයිස්තුවේ නම් පෙනෙන අයවලුන්ගෙන් ඉතාම වැඩි ඉල්ලුම්කාරයාට ඉඩම විකුණනවා ඇත. ඒ ඇර මෙම කොන්දේසිවලට එකඟව, එවැනි කොන්දේසිවලට බැඳී, ඊට සාක්ෂි වශයෙන්, මෙම කොන්දේසිගේ එක පිටපතකට ගැණුම්කාරයා විසින් අත්සන් තබන්ටත් ඕනෑය.

5. ඉඩම විකිණීමේ දින පටන් අවුරුද්දක කාලයක් ඇතුලතදී, මුදලට ගත් අය විසින් ඔහුගේම වියදමින් ඉඩමේ තිබෙන වල් වසාදමන්ට ඕනෑවත් ඇර, එම වල් වසාදමන්ට භාරගනිමින්, විකිණීමේ දින පටන් මාසයක් ඇතුලතදී ඔහුගේම වියදමෙන් සාදනලද විශෙෂ පොරොන්දුවකට බැඳී අත්සන් තබන්ටත් ඕනෑය.

6. ඉඩම මිලේට ගත් අය විසින් ඉහත සඳහම්වූ ආකාර ඉෂ්ට කිරීමට අවුරුද්දක් ඇතුලතදී බැරිවුණොත් හෝ අතපසු කරන්ට යෙදුනොත් නොහොත් කොන්දේසිවල 5වෙනි වගන්තියෙන් පෙන්නුම්කරණ ප්‍රකාර පොරොන්දු ඉෂ්ට නොකළොත් එසේ මුදලට ගත් අය විසින් ගෙවා තිබෙන මුදල දඩයක් වශයෙන් ගෙනාව ආණ්ඩුවට පැමිණුන පාඩුව පිලිවිසට රජසන්තක කර ඉඩමේ අයිතිවාසිකම හෝ එහි ප්‍රයෝජන ආණ්ඩුවට තබාගන්නවා ඇත.

7. ඉහත සඳහම් කොන්දේසිවල 5වෙනි වගන්තියෙන් නියමකර තිබෙන පංගාරතුවල ප්‍රකාර ගැණුම්කාරයා විසින් පොරොන්දු ඉෂ්ටකළොත් මිස නැත්නම් එසේ ඒ පොරොන්දු ඉෂ්ටකරනතුරු ගැණුම්කාරයා නමට ආණ්ඩුවෙන් ඔප්පුවක් සාදාදෙනු නොලැබේ.

හැඩුල් පත්‍රය.

බස්නාහිර දිසාවේ කොළඹ දිස්ත්‍රික්කුවේ දකුණු අළුත්කුරු කෝරලේ රාගම්පත්තුවේ රද්දොළුවේ පිහිටි කඳුරුගහවත්ත නමැති නො. 19,678වේ මුල් සිතියමේ පෙනෙන නො. 1කේ ආණ්ඩුවට අයිති බිම්කට්ටිය.

ඇත්දම—පණස් අවුරුදු වයසැති පොල්ගස් 32ක්, අට අවුරුදු පොල්ගහක්, අවුරුදු 10–20 දක්වා වයසැති කොස්ගස් 3ක්, පරන ගල්වල් 2ක් සහ අඩිපාරකින් කොටසක්.

| බිම් කට්ටිය. | ඉඩමේ නම. | මහත. අ. රූ. ප. | තක්සේරු මිල. රු. |
|---|---|---|---|
| 1 | කඳුරුගහවත්ත | .. 1 1 30 | 500 |

මෙම ඉඩම ගැණ වැඩිදුර තොරතුරු බස්නාහිර දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, එහි පිඹුරුකබදසි ගැණ සර්වෙයර් ජනරල් උන්නාන්සේගෙන්ද දැනගතහැක.

ති. එච්. බෝර්ඩිලන්,
මහලේකම් වෙනුව.

වර්ෂ 1931ක්වූ මැයි මස 29වෙනි දින කොළඹ මහලේකම් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

---

1. පුත්තලම් දිස්ත්‍රික්කයේ නාච්චිකල්ලියේ ලුණු අලවේ තිබෙන මුරකාරයින්ගේ ගෙවල් අටත්ද, කොන්ස්ටබල් වරුන්ගේ ගෙවල් දෙකක්ද, මුදලෙප්රුගේ ගෙයද, ලුණු ප්‍රධාන මහතාගේ ගමන් බංගලාවද අළුත්වැඩියාකිරීම සඳහා ටැන්ඩර්පත්‍ර මා විසින් භාරගනු ලැබේ.

2. ටැන්ඩර්පත්‍ර සීල්කරපු ඇන්විලොප් තුල දමා, එම ඇන්විලොප්වල වම්පැත්තේ "නාච්චිකල්ලියේ ලුණු දෙපාතමේන්තුවේ ගෙවල් අලුත්වැඩියාකිරීමට ටැන්ඩර්පත්‍රය" කියා ලියා, වර්ෂ 1931ක්වූ ජූනි මස 10වෙනි දින පස්වරු 1ට ප්‍රථම මා වෙත ලැබෙනලෙස එවිය යුතුයි.

3. ටැන්ඩර්පත්‍රයක් එවනවිට, කච්චේරියක රු. 20ක් බැඳ, ඊට ලබාගන්නාලද තුන්ඩුවද එම ටැන්ඩර්පත්‍රයට අමුනා එවිය යුතුයි.

4. මෙකී මුදල, ඉල්ලුම්කාරයාගේ ටැන්ඩරය බාරගෙන සෑහෙන කාලයක් ඇතුලතදී වැඩ සම්පූර්ණකරණ හැටියට "ඇග්‍රිමන්ට්" එකක් අත්සන්කරණතුරු ආපසු දෙනු නොලැබේ. භාරනොගන්නා සියලුම ටැන්ඩර්වලට බඳින මුදල් ආපසු දෙනුලැබේ. මා විසින් භාරගන්නාලද ටැන්ඩර්කාරයා "ඇග්‍රිමන්ට්" එකකට නොබැඳුනොත්, ඔහුගේ මුදල රජසන්තක වෙන බව මෙයින් වැඩිදුරටත් දැනුම්දෙමි.

5. ටැන්ඩර්කාරයාට පුත්තලමේදී ලිපුම් ලැබීමට ඇඩ්‍රැස් එකක් නියමකරන්ට ඕනෑය.

6. "ඇග්‍රිමන්ට්" එක අත්සන්කරන දිනයේ සිට මාස දෙකක් ඇතුළත, ඉශත දක්වනලද සියලුම වැඩ අවසාන කරන්ට ඕනෑ බවද දැනුම්දෙමි.

7. වැඩිදුර මේ ගැන තවත් කාරණා මගෙන් හෝ පුත්තලමේ ලුණු දෙපාතමේන්තුවේ සුපිරින්ටැන්ඩන්ට් මහතාගෙන්ද දැනගතහැක.

8. ඉල්ලුම්පත්‍රය උප ඒජන්ත උන්නාන්සේට යවන්නාවූ වේලාවටම එහි පිටපතක් ඉල්ලුම්කාරයා විසින් තැපැලෙන් කොළඹ ගරුකටයුතු ආඥයම් පරීක්ෂක උන්නාන්සේට එම දවසේම යැවියයුතුයි.

ජෙ. ඇල්වා පුල්ලෙ,
උප ඒජන්ත උන්නාන්සේ වෙනුවට.

වර්ෂ 1931ක්වූ මැයි මස 26වෙනි දින පුත්තලමේ කච්චේරියේදීය,

---

තොටුපල් රේන්ද විකිණීම.

වර්ෂ 1931ක්වූ ඔක්තෝබර් මස 1වෙනි දින පටන් වර්ෂ 1932ක්වූ සැප්තැම්බර් මස 30වෙනි දින දක්වා මෙහි පහත සඳහන්වන කෑගල්ල දිස්ත්‍රික්කේ තොටුපල් රේන්ද මිලයට ගැනීමට එවන මුද්‍රලත් ඉල්ලුම්පත්‍ර කෑගල්ල දිස්ත්‍රික්කේ ආණ්ඩුවේ උප ඒජන්තතැන විසින් වර 1931ක්වූ අගෝස්තු මස 3වෙනි සඳුදා උදේ 10 වනතුරු කෑගල්ලේ කච්චේරියේදී භාරගන්ට යොදන බව මෙයින් දැනුම්දෙමි.

2. (a) මෙහි පහත සඳහන් රේන්දවලට ඉල්ලුම්පත්‍ර කරුවෝම පැමිණ සිටියයුතුයි. එසේ නැත්නම් ඔවුන්ගේ යුතු ප්‍රකාර බලයලත් ඒජන්තවරු විසින් ඉල්ලුම්පත්‍රවල සත්‍යතාවය ආණ්ඩුවේ උප ඒජන්ත උන්නාන්සේට පෙන්නාසිටිය යුතුයි.

(b) ඉල්ලුම්පත්‍රවල පිට කවරය නොහොත් (ඇන්විලොප් එක මතුපිට) වම්පැත්තේ උඩ කෙලවරේ "Tender for Toll Rent" කියා ලකුණුකරන්ට ඕනෑය.

3. භාරගන්නාලද ඉල්ලුම්පත්‍රය අයිතිකාරයා විසින් ගත් මුදලෙන් දහයෙන් කොටසක් වහාම කච්චේරියේ තැන්පත් කරන්ට ඕනෑය. එකී විකිණීමේ දින පටන් දවස් 30ක් ඇතුලතදී එම ඉල්ලූ ගණනින් දෙකෙන් පංගුවකට වටිනා ඇප ඒත්තුගත් මුද්‍ර ඔප්පුවලින් හෝ තුනෙන් පංගුවකට වටිනා ඇප මුදලෙන් හෝ තබා සම්පූර්ණකරන්ට ඕනෑය.

4. ඇප පිණිස තබනලද ඔප්පු සෝදිසිකිරීම සඳහා ආණ්ඩුවේ අද්වකාත්තුමාට වගවියයුතු ගාස්තුවද ඇප ඔප්පු සෑදීමටද, ඒවා සෝදිසිකර සම්පූර්ණකිරීමටද, ඉඩම් තක්සේරුකිරීමට හා ඇප ඔප්පු රෙජිස්ටර්කිරීමටද ගෙවියයුතු ගාස්තුත් ඔහු විසින් ගෙවීමට මෙහි තබන්ට ඕනෑය.

5. සවස 6 සිට උදේ 5.30 දක්වා තොටුපල දෙපැත්තේ යාර 100ක දුර සිට පෙණෙනාකාර රතු එලි දෙකක් දැමිය යුතුයි.

6. ඇප වෙනුවෙන් බඳිනලද ඉඩම්වල ඔප්පු ඒවා මීට ප්‍රථම ඇපෙකට නොහොත් උකසකට බැඳීනැති බවට ඉඩම් ලියාපදිංචිකරන රෙජිස්ත්‍රාත්තැනගෙන් සහතිකපත්‍රයක් ලබාගත යුතුයි. මේ සහතිකපත්‍රය ලබාගැණීමට ඕනෑ කරණ වියදම ඇප තබන අය විසින් දැරිය යුතුයි.

7. මේ ගැන වැඩිදුර කාරණා කෑගල්ලේ උප ඒජන්ත උප ඒජන්ත උන්නාන්සේගෙන් ඉල්ලා දැනගත යුතුයි.

(1) කෑගල්ල දිස්ත්‍රික්කේ රුවන්වැල්ලේ කැලණිගඟේ තොටුපල් රේන්දය,

(2) රුවන්වැල්ලට තුදුරුවූ අඟුරුවැල්ලේ ගුරුකඩමගේ තොටුපල් රේන්දය. මෙයින් එක රේන්දපලක රේන්ද කාසි ගෙවීමෙවාත් ඒ දවසතුලදී අනික් රේනදපලෙන් ගෙවීම නිදහස්ය:

(3) මාපිටිගම රේන්දපල.

4. අලව්වේ මහඔය තොටුපල.

වර්ෂ 1932ක් සැප්තැම්බර් මස 30වෙනි දිනට මත්තෙන් අලව්වේ පාලමේ වැඩ අවසන්වන්නේ නැත.

ඩබ්ලිව්. ඕ. ස්ටීවන්ස්,
උප ඒජන්ත උන්නාන්සේ.

වර්ෂ 1931ක්වූ මැයි මස 29වෙනි දින කෑගල්ලේ කච්චේරියේදීය.

PRINTED AT THE CEYLON GOVERNMENT PRESS, COLOMBO.